පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය -492

ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-ගාල්ල

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බනධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் -492

நிறுவனத்தின் பெயர் : காலி மாவட்ட செயலகம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் நிறுவனங்களுக்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Parliamentary Series No -492**

**Name of the institution -District Secretariat Galle**

**Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)**

<table>
<tr><th>වාර්තාවෙන් හදුනාගෙන ඇති අඩුපාඩු (2023)</th><th>අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය</th></tr>
<tr><td>පළමු කොටස</td><td></td></tr>
<tr><td>අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.</td><td>
දිස්ත්‍රික් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වලදි ප්‍රාදේශීය ලේකම් සාකච්ඡාවන්හිදි හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වලදි අභ්‍යන්තර විගණන වාර්තා සඳහා නියමිත කාලය තුල පිළිතුරු සැපයීම ප්‍රමුඛ කාර්යක් සේ සලකා කටයුතු කලයුතු බවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්, සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් හා සියළුම අංශ ප්‍රධානීන් දැනුවත් කිරිමට කටයුතු කර ඇත.
<table>
<tr><th>වර්ෂය</th><th>ඉදිරිපත් කරන ලද විගණන වාර්තා ගණන</th><th>මසක් තුල පිළිතුරු ලබාදීමේ ප්‍රමාණය</th><th>ප්‍රතිශතය</th></tr>
<tr><td>2022</td><td>88</td><td>50</td><td>57 %</td></tr>
<tr><td>2023</td><td>109</td><td>69</td><td>63 %</td></tr>
<tr><td>2024</td><td>131</td><td>130</td><td>99 %</td></tr>
<tr><td>2025</td><td>150</td><td>126</td><td>84 %</td></tr>
</table>
</td></tr>
<tr><td>පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.</td><td>
පොදු තැන්පතු ගිණුමේ නිරවුල් නොවූ ශේෂයන් පිළිබඳ වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.
<table>
<tr><th rowspan="2">භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම් අංකය.</th><th colspan="2">2023/12/31 දිනට කල් ඉකුත් වූ තැන්පතු ශේෂය.</th><th colspan="2">2025/12/31 දිනට ශේෂය.</th><th rowspan="2">විස්තරය</th></tr>
<tr><th>රුපියල්</th><th>ශත</th><th>රුපියල්</th><th>ශත</th></tr>
<tr><td>6000-0-0-002-0-094-0</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td></td></tr>
<tr><td>6000-0-0-013-0-062-0</td><td>10,072,460</td><td>20</td><td>-</td><td>-</td><td>නිදහස් කර අවසන්</td></tr>
<tr><td>6000-0-0-017-0-015-0</td><td>97,718</td><td>50</td><td>-</td><td>-</td><td>නිදහස් කර අවසන්</td></tr>
<tr><td>6000-0-0-016-0-045-0</td><td>201,659,426</td><td>75</td><td>19,169,426</td><td>44</td><td>
➢ රු :9,821,865.39 ක මුදලක් නිදහස් කර ඇත.<br>
➢ රු 172,668,134.92 ක මුදලක් රාජ්‍ය ආදායමට බැර කර ඇත. විස්තර පහත පරිදි වේ.
<table>
<tr><th colspan="2">තැන්පත් කල මුදල.</th><th rowspan="2">විස්තරය.</th></tr>
<tr><th>රුපියල්</th><th>ශත</th></tr>
<tr><td>167,993,279</td><td>99</td><td>ද.ප. ඉංජිනේරු සංස්ථාව විසින් සිදු කරන ලද පළාත් මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතියට අදාලව මාර්ග 328 ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබෙන කාලය වසර 02 ඉක්මවා ඇති රැඳවුම් මුදල් රජයේ විගණන අංශයේ උපදෙස් මත හා දි.ලේ. තුමාගේ අනුමැතිය මත 2024/12/31 දින රජයේ ආදායම් ගිණුමට බැර කිරීම.</td></tr>
<tr><td>2,239,180</td><td>07</td><td>වසර 02 ඉක්මවා ඇති සැලසුම් අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ගංවතුරින් හානි වූ මාර්ග</td></tr>
</table>
</td></tr>
</table>
</td></tr>
</table>

| | | |
|---|---|---|
| | | පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් 2024/12/31 දින රජයේ ආදායමට බැර කිරීම. |
| 627,535 | 45 | ගාල්ල සමනල උද්‍යානයේ විසිතුරු මසුන් බෝ කිරීමේ හා ප්‍රදර්ශනය කිරීමේ ව්‍යාපෘතියේ රැඳවුම්, 2024/12/31 දින රජයේ ආදායමට බැර කිරීම. |
| 1,808,139 | 41 | වසර 05 ඉක්මවා ඇති සැලසුම් අංශය විසින් ක්‍රියාත්මක කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති වල රැඳවුම්, 2024/12/31 දින රජයේ ආදායමට බැර කිරීම. |
| **172,668,134** | **92** | |

➢ රු 19,169,426.44 :ක රැඳවුම්, ව්‍යාපෘති උපදේශක නිර්දේශ ලද පසු සන්කෙන් කන්ස්ට්‍රක්ෂන් ආයතනවෙත නිදහස් කිරිමට කටයුතු කරනු ලැබේ.විස්තර පහත පරිදි වේ.

| මුදල් තැන්පත් කල දිනය | තැන්පතු මුදල රු. | විස්තරය |
|---|---|---|
| 2019.12.31 | 2,250,646.90 | ආසන 2000 ශ්‍රවනාගාරය ඉදිකිරීමේ අත්තිවාරම් යෙදීම 2 බිල්පතේ රැඳවුම්-10% - 2,083,932.31 ,වැට් - 166,714.59 |
| 2019.12.30 | 1,647,480.92 | ආසන 2000 ශ්‍රවනාගාරය ඉදිකිරීමේ අත්තිවාරම් යෙදීම2 බිල්පතේ රැඳවුම්-10% |
| 2020.02.26 | 2,577,862.03 | ආසන 2000 ශ්‍රවනාගාරය ඉදිකිරීමේ වැඩ අත්තිකාරම 3 බිල්පත නිරවුල් කිරීමේ රැඳවුම් |
| 2020.03.30 | 3,700,702.52 | ආසන 2000 ශ්‍රවනාගාරය ඉදිකිරීමේ වැඩ අත්තිකාරම 4 බිල්පත නිරවුල් කිරීමේ රැඳවුම් 10% රැඳවුම් මුදල රු. 3,426,576.40 , වැට් රු. 274,126.12 |
| 2020.04.30 | 747,501.10 | ආසන 2000 ශ්‍රවනාගාරය ඉදිකිරීමේ වැඩ අත්තිකාරම 5 බිල්පත නිරවුල් කිරීමේ රැඳවුම් |
| 2020.11.17 | 3,022,414.68 | ආසන 2000 ශ්‍රවනාගාරය ඉදිකිරීමේ රැඳවුම් |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 2020.12.09 | 2,125,382.84 | ආසන 2000 ශ්‍රවනාගාරය ඉදිකිරිමේ වැඩ අත්තිවාරම 4 බිල්පතේ කොටසක් ගෙවීමේ රුඳවුම් |
| | | | | | | | 2021.03.30 | 1,964,061.41 | ආසන 2000 ශ්‍රවනාගාරය ඉදිකිරිමේ 7 වන බිල්පත නිරවුල් කිරිමේ රුඳවුම් |
| | | | | | | | 2021.03.18 | 1,133,374.04 | ආසන 2000 ශ්‍රවනාගාරය ඉදිකිරිමේ 6 වන බිල්පත නිරවුල් කිරිමේ රුඳවුම් |
| | | | | | | | | **19,169,426.44** | |

| | |
|---|---|
| මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී දින 10 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | විධිමත් පසු විපරම් ක්‍රියාවලියක් තුලින් අදාල කාර්ය නිමවූ වහාම නියමිත දිනට පියවා ගැනීමට කටයුතු කරමි. |
| දෙවැනි කොටස | |
| මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | 2022 වර්ෂය අවසාන භාගය වන විට මුහුණ දුන් ආර්ථික අර්බුධය හේතුවෙන් රාජ්‍ය වියදම් කළමනාකරණය කිරිමේ අවශ්‍යතාවය මත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව භෞතිකව පැවැත්වීමට නොහැකිවූ අතර සැළකියයුතු රැස්වීම් ප්‍රමාණයක් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වා ඇත.ඉන් අනතුරුව 2023 වර්ෂයේ ජූලි මස සිට සෑම මසකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇත.<br><br>මේ වන විට රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2025.09.01 දින නිකුත් කරන ලද 03/2025 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු ප්‍රතිසංවිධාන චක්‍රලේඛයට අනුව,කාර්තුවකට එක් වතාවක් අනිවාර්යයෙන් රැස්වීම් පැවැත්වීමට උපදෙස් දී ඇත.ඒ අනුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා ඇති අතර ඉදිරියේදි පැවැත්වීමට කටයුතු කරමි. |
| දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස්වී නොතිබුණි. | 2016.06.22 දිනැති අමාත්‍ය මණ්ඩල සටහන අනුව නිවාස කමිටුවේ කැඳවුම්කරු ලෙස අදාළ දිස්ත්‍රික්කයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමණාකරු කටයුතු කලයුතු බව දන්වා ඇත.එසේම එහි සම සභාපතිත්වයක් පමණක් දිස්ත්‍රික් ලේකම් වෙත පවරා ඇත.2022 වර්ෂයේද දිස්ත්‍රික් නිවාස කමිටුව කැඳවා නොමැති අතර ඒ අනුව රැස්වීමක්ද සිදුවී නොමැත.<br><br>මෙම කරුණ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පාලනය කල නොහැකි කරුණක් වන බැවින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳව ඇගයීම සඳහා සකස් කර ඇති මාර්ග ගත තොරතුරු කළමනාකරණ ප්‍රශ්නාවලියෙන් මෙම දිස්ත්‍රික් නිවාස කමිටුව පැවැත්වීම සම්බන්ධව වන ඇගයීම වෙනස් කිරිම සුදුසු බව යෝජනා කර මාගේ සමාංක DSG/FIN/16/03/05/2025 දරණ හා 2026.01.06 දිනැති ලිපිය මගින් පාර්ලිමේන්තු මහ ලේකම් වෙත දන්වා ඇත. |
| දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්වී නොතිබුණි. | 2021 වර්ෂයේ යල හා මහ කන්න සඳහා වගා ඉලක්ක ලබා ගැනීමට රැස්වීම් 02 ක් හා පසු ඇගයීම් හා නිරීක්ෂණ වලට අදාළ කරුණු සාකච්ඡා කිරිමට රැස්වීම් 02 ක් සිදුකර ඇත.2022 වර්ෂයේදි රජයේ විශේෂ කාබනික පොහොර වැඩසටහන හේතුවෙන් දිස්ත්‍රික්කයේ නව කාබනික පොහොර නිශ්පාදකයින් හඳුනා ගැනීම සහ ඒ ආශ්‍රිතව පැන නැගුණ ප්‍රායෝගික ගැටළුකාරි ත්ත්ත්වයන් මග හරවා ගැනීමට මාසිකව රැස්වීම් පැවැත්වූ අතර තවද එම වර්ෂයේ හඳුන්වා දුන් කාබනික පොහොර සහනාධාර ක්‍රමයේ සංකීර්ණතා හා නිරන්තරව මතුවූ ගැටළු |

| | |
|---|---|
| | හේතුවෙන් මාසිකව රැස්වීම් 12 ක් පවත්වා ඇත.<br><br>සාමාන්‍යයෙන් වර්ෂයක් සඳහා යල හා මහ කන්න සඳහා වගා ඉලක්ක ලබා ගැනීම සඳහා පොහොර අනු කමිටු 02ක් පවත්වන අතර විශේෂිත අවස්ථාවලදී පොහොර අනු කමිටුවට අමතරව ගැටළුවක් මතුවුවහොත් පොහොර අනු කමිටුවට සහභාගිවන නිලධාරීන්ම දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට සහභාගිවන බැවින් අවශ්‍යතාවය මත දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී එම ගැටළු සාකච්ඡා කරන ලදී.<br><br>2023 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය කමිටු පැවැත්වීමේ කාල සටහනට පොහොර අංශය මගින් ලබාදුන් දින අනුව (2023.02.20 දින හා 2023.08.29 දින දෙකෙහි පොහොර අනු කමිටුව පවත්වන ලද අතර 2023.04.25 දින සහ 2023.10.03 දිනයන්හි කෘෂිකර්ම කමිටුවට සමගාමීව පොහොර අනු කමිටු පවත්වන ලදී. සාමාන්‍ය පරිදි පොහොර අනු කමිටු රැස්වීම් වාර 02ක් පැවැත්වීම ප්‍රමාණවත් බැවින් මාසිකව අනු කමිටු පවත්වා නොමැත.<br><br>2025.12.03 දින කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ Zoom තාක්ෂණය ඔස්සේ සිදුකරන ලද රැස්වීමේදී මේ පිළිබඳ කල විමසීමේදී වගා කන්නයේ ඉලක්ක ලබා ගැනීම සඳහා පමණක් රැස්වීම් 02ක් හා අවශ්‍යතාවයක් පැන නගින පරිදි දිසාපතිවරයාට කමිටුවක් කැඳවා ගැනීමට හැකිවන ලෙස මෙය සංශෝධනය කරනු ලබන බව පවසා ඇත. ඒ අනුව 2021.02.22 දිනැති කෘෂිකර්ම අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක NFS/2021/01 අනුව දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්විය යුතුය යන්න වෙනස් වියයුතු බවට මාගේ සමාංක DSG/FIN/16/03/05/2025 දරණ හා 2026.01.06 දිනැති ලිපිය මගින් පාර්ලිමේන්තු මහ ලේකම් වෙත දන්වා ඇත. |
| දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව මාසිකව රැස්වී නොතිබුණි. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2022.03.21 දිනැති ලිපියට පෙර සෑම වර්ෂයකම මිළ කමිටු පවත්වා ඇත්තේ වසරේ පළමු භාගය සහ දෙවන භාගය සඳහා වසරකට දෙවතාවක් පමණි. නමුත් 2022 වසරේ වෙළඳපොළෙහි මිල සීඝ්‍ර උච්චාවචනයන් සිදු වූ බැවින් ඉහත 2022.03.21 දිනැති ලිපිය මගින් උපදෙස් දී ඇත්තේ මාසිකව මිළ කමිටු රැස්වීම් පවත්වන ලෙසයි. ඒ අනුව එතැන් සිට 2023 මාර්තු දක්වා මාසිකව රැස්වීම් පවත්වා ඇත. 2023 මාර්තු වලින් පසු වෙළඳපොළ මිළ ගණන් ස්ථාවර වූ බැවින් මාසිකව කමිටු පැවැත්වීම අවශ්‍ය නොවූ බැවින් මිළ කමිටුව හා සම්බන්ධ අනෙකුත් ආයතන ද සමඟ සාකච්ඡා කර මිළ කමිටු පෙර පරිදි වසරකට දෙවතාවක් පමණක් පවත්වා ලදී.<br><br>ඒ අනුව 2025 වර්ෂයේ දී පහත සඳහන් දින දෙකේදී මිළ නියම කිරීමේ කමිටු රැස්වීම් පවත්වා ඇත.<br>• ජනවාරි 22<br>• ජුනි 25<br>ඉදිකිරීම් මිළ ගණන් මාසිකව යාවත්කාලීන කිරීම පිළිබඳ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2022.03.21 දිනැති උපදෙස් ලිපිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව මාසිකව රුස්විය යුතුය යන්න වෙනස් වියයුතු බවත් දක්වමින් මාගේ සමාංක DSG/FIN/16/03/05/2025 දරණ හා 2026.01.06 දිනැති ලිපිය මගින් පාර්ලිමේන්තු මහ ලේකම් වෙත දන්වා ඇත. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය. | 2024 වර්ෂයට අදාලව යටත් මට්ටමේ විගණන මතයක් පවතී. පවතින අඩුපාඩු අවම කර ගැනීම තුලින් ඉදිරි වර්ෂ කිහිපය ඇතුළත පැහැදිලි මතයක් ලබා ගැනීමට කටයුතු කරමි. |
| සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබුණු පුහුණු අවස්ථා | 2023 වර්ෂයෙහි 261-1-1-0-2401 / 261-1-2-0-2401 වැය විෂය යටතේ ලද ප්‍රතිපාදනය රු.6,000,000.00 හි වියදම රු.1,304,008.50 වේ. ඒ අනුව එහි ඉතිරිය රු. 4,695,991.50 ක් වේ.<br>මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛ අංක 01/2023 චක්‍රලේඛයේ 6 (ඇ) ඡේදයට අනුව |

| | |
|---|---|
| ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවතුණි. | කාර්යමණ්ඩල පුහුණු සඳහා වන වියදම් යටතේ දේශීය පුහුණු අවස්ථා ලබා දීමේදී සේවා ව්‍යවස්ථා, බඳවාගැනීමේ පටිපාටි හා චක්‍රලේඛ විධිවිධාන අනුව, ඒ ඒ නිලධාරීන් විසින් සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් පුහුණු අවස්ථා ලබා දිය යුතු බව දන්වා ඇති හෙයින් 2023 වර්ෂයේ සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් 01/2023 අයවැය චක්‍රලේඛයට යටත්ව පැවැත්වීමට නොහැකි වූ බැවින් සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුනද 2024 වර්ෂයේ දී 93% ක් ලෙස සමස්ථ ප්‍රගතියෙහි වර්ධනයක් පෙන්නුම් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි. | උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් වැඩි ප්‍රමාණයක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්ෂික ස්ථානමාරු යටතේද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් 2024 හා 2025 වර්ෂවල කරන ලද අභ්‍යන්තර ස්ථාන මාරු යටතේද ස්ථානමාරු කිරීමට කටයුතු කර ඇත. |
| තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යාංශයේ 2016.11.17 දිනැති අංක SDW/3/3/16-2016 චක්‍රලේඛයේ උපදෙස් පරිදි වන අලි හානි හා වෙනත් වන සතුන්ගෙන් සිදුවන හානි පිළිබඳ වන්දි කමිටුව රැස්වී නොතිබුණි. | 2023 වර්ෂයේ අලි හා වෙනත් වන සතුන්ගෙන් හානි සිදුවීම් දිස්තික්කය තුළ වාර්තා නොවූ බැවින් ප්‍රතිලාභීන් විසින් හෝ ප්‍රාදේශීය ලේකම්වරු විසින් වන්දි ඉල්ලීම් සිදුකර නොමැත.එබැවින් කමිටුව රැස්වීමේ අවශ්‍යතාවයක් මතු නොවිය. ජීවිත හෝ දේපල හානි වීම් වාර්තාවන අවස්ථාවලදී කඩිනමින් වන්දී කමිටුව රැස්ව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ සූදානමක් දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වේ.ඒ අනුව 2024 වර්ෂය තුළ කමිටුව රැස්ව ඇති බව දන්වමි. |

.......................................

**කේ.යු.චන්ද්‍රලාල්,**
**දිස්ත්‍රික් ලේකම්/දිසාපති,**
**ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය.**

.......................................

**බී.එල්.ඒ කුමාර,**
**ප්‍රධාන ගණකාධිකාරී,**
**ගාල්ල දිස්ත්‍රික් ලේකම් වෙනුවට.**

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය ප[illegible]න, පළාත් සභා සහ
[illegible]
සිදුහස් [illegible] - කොළඹ 07.